# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2083/37 - 2018 අගෝස්තු මස 10 වැනි සිකුරාදා - 2018.08.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 20 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මලික් සමරවික්‍රම,
සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍ය.

2018 අගෝස්තු මස 10 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

මෙම නියෝග 2018 අංක 3 දරන ආනයන හා අපනයන පාලන නියෝග යනුවෙන් හඳුන්වනු ලබේ. 2013 අප්‍රේල් මස 3 වන දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍ර* අංක 1804/17 හා 2018 ජූලි මස 13 වන දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍ර* අංක 2079/70 මෙ මගින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

(2) ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන සියලුම මෝටර් වාහන 1980 අංක 47 දරන ජාතික පරිසර පනත යටතේ ප්‍රසිද්ධ කරන ලද 2018.07.12 දිනැති අංක 2079/42 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* තුන්වන උපලේඛනයෙහි හෝ 2018.08.06 දිනැති අංක 2083/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පස් වන උපලේඛනයෙහි සඳහන් වාහන වායු විමෝචන සීමාවන්ට හා කලින් කලට කරනු ලබන සංශෝධනයට ද අනුකූල විය යුතු ය.

(3) මෙහි උපලේඛන I හි IV වන තීරයේ දැක්වෙන සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන සියලු මෝටර් වාහන උපලේඛන I හි III වන තීරයේ සඳහන් ආරක්ෂණ මිනුම්/ප්‍රමිතීන් සමග අනුගත විය යුතුය.

(4) මෙම නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා,

(අ) සංයෝජිත වර්ගීකරණ 87 පරිච්ඡේදය යටතේ ආනයනය කරනු ලබන පාවිච්චි නොකරන ලද මෝටර් වාහන සඳහා නිෂ්පාදන ආයතනය විසින් නිකුත් කරනු ලබන නිෂ්පාදන සහතිකයක් ඉදිරිපත් කළ යුතු අතර දක්වන ලද වායු විමෝචන ප්‍රමිතින් හා ආරක්ෂණ මිනුම්/ප්‍රමිතීන්ට අනුකූල බව එහි සඳහන් වියයුතු ය.

(ආ) ඉහත (අ) හි දැක්වෙන පාවිච්චි නො කරන ලද මෝටර් වාහන හැර ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන අනෙකුත් සියලු මෝටර් වාහනකලින් කලට සංශෝධිත 2013 අප්‍රේල් මස 3 වන දිනැති අංක 1804/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 3 වන වගන්තියේ දැක්වන පූර්ව නැව්ගත කිරීමේ පරීක්ෂණ සහතිකය මගින් ඉහත සඳහන් වාහන වායු විමෝචන ප්‍රමිතීන් හා ආරක්ෂණ මිනුම්/ප්‍රමිතීන්ට අනුගත බව තහවුරු කළ යුතු ය. 2013 අප්‍රේල් මස 3 වන දිනැති අංක 1804/17 *අති විශෙෂ ගැසට් පත්‍රය* හා කලින් කලට කරනු ලබන සංශෝධනයන් අනුව පත් කරනු ලබන බලයලත් පරීක්ෂකවරුන් විසින් පමණක් පූර්ව නැව්ගත කිරීමේ සහතිකය නිකුත් කළ යුතුය.

(5) නියෝග අංක 3 හි සඳහන් ආරක්ෂණ මිණුම්/ ප්‍රමිතීන්, උපලේඛන II හි සඳහන් සංයෝජිත වර්ගීකරණ ශීර්ෂයන් යටතට ගැනෙන මෝටර් වාහන සඳහා අදාළ නොවේ.

(6) සංයෝජිත වර්ගීකරණ 87 වන පරිච්ඡේදය යටතේ වර්ගීකරණ වන මෝටර් වාහන ආනයනය කළ යුත්තේ අදාළ මෝටර් වාහන නැව් ගත කිරීමට පෙර විවෘත කළ යුතු ණයවර ලිපි මගින් පමණි.

මෙම නියෝගයන්හි සඳහන් කර ඇති විමෝචන ප්‍රමිති සහ ආරක්ෂණ මිණුම්/ප්‍රමිතීන් මෝටර් වාහන ආනයනය සඳහා පිළිපැදිය යුතු අනිවාර්ය අවශ්‍යතාවන් වශයෙන් ණයවර ලිපිවල දැක්විය යුතුය.

(7) එකී වායු විමෝචන ප්‍රමිතීන් සහ ආරක්ෂණ මිණුම්/ප්‍රමිතීන්වලට අනුකූල නොවන්නා වූ ආනයනික මෝටර් වාහන, ආනයනකරු/කරුවන් විසින් තම වියදමින් ප්‍රති අපනයනය කළ යුතු ය.

(8) 2018 ජුලි මස 13 වන දින හෝ ඊට පෙර විවෘත කරන ලද ණයවර ලිපි මත ආනයනය කරනු ලබන මෝටර් වාහන සඳහා මෙම විධිවිධාන අදාළ නොවේ. එම ණයවර ලිපි සංශෝධනය නොකළ යුතු අතර අදාළ ආනයනය කරන ලද මෝටර් වාහන 2018 ඔක්තෝබර් මස 31 වන දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කළ යුතුය.

**උපලේඛන I. (ආරක්ෂණ ප්‍රමිතීන්/මිණුම් වියයුතු)**

| *I* | *II* | *III* | | | *IV* | *V* |
|---|---|---|---|---|---|---|
| *අංක* | *සංයෝජිත වර්ගීකරණ* | *ආරක්ෂණ මිණුම්* | | | *අදාළ සංයෝජිත වර්ගීකරණ සංකේතය* | *අදාළ නොවන සංයෝජිත වර්ගීකරණ සංකේතය* |
| | | *වායු බැලුන* | *ආසන පටි* | *ABS* | | |
| 01 | 87.02 | C | C | C | 8702.10.12,8702.10.13,<br>8702.10.19,8702.10.21,<br>8702.10.29,8702.10.32,<br>8702.10.33,8702.10.39,<br>8702.10.41,8702.10.49<br><br>8702.20.11,8702.20.12,<br>8702.20.19,8702.20.21,<br>8702.20.29,8702.20.31,<br>8702.20.32,8702.20.39,<br>8702.20.41,8702.20.49<br><br>8702.30.11,8702.30.12,<br>8702.30.19,8702.30.21,<br>8702.30.29,8702.30.31,<br>8702.30.32,8702.30.39,<br>8702.30.41,8702.30.49 | IVතීරයෙහි සඳහන් සංයෝජිත වර්ගීකරණ සංකේත හැර 87.02 ශීර්ෂය යටතේ ඇති සංයෝජිත වර්ගීකරණ සංකේත |

උපලේඛන I. (ආරක්ෂණ ප්‍රමිතීන්/මිණුම් වියයුතු) (සම්බන්ධිතයි)

| I | II | III | | | IV | V |
|---|---|---|---|---|---|---|
| අංක | සංයෝජිත වර්ගීකරණ | ආරක්ෂණමිණුම් | | | අදාල සංයෝජිත වර්ගීකරණ සංකේතය | අදාල නොවන සංයෝජිත වර්ගීකරණ සංකේතය |
| | | වායු බැලුන | ආසන පටි | ABS | | |
| | | | | | 8702.40.11,8702.40.12,<br>8702.40.19,8702.40.21,<br>8702.40.29,8702.40.31,<br>8702.40.32,8702.40.39,<br>8702.40.41, 8702.40.49<br><br>8702.90.12, 8702.90.13,<br>8702.90.19, 8702.90.21,<br>8702.90.29, 8702.90.32,<br>8702.90.33, 8702.90.39,<br>8702.90.41, 8702.90.49 | |
| 02 | 87.03 | C | C | C | V තීරයෙහි සඳහන් සංයෝජිත වර්ගීකරණ සංකේත හැර 87.03 ශීර්ෂය යටතේ ඇති සංයෝජිත වර්ගීකරණ සංකේත | 8703.10.11, 8703.10.19,<br>8703.10.21, 8703.10.29<br><br>8703.21.30, 8703.21.40,<br>8703.21.51, 8703.21.52,<br>8703.21.53, 8703.21.54,<br>8703.21.55, 8703.21.62,<br>8703.21.64, 8703.21.73<br><br>8703.22.30, 8703.22.40<br><br>8703.23.30, 8703.23.40<br><br>8703.24.30, 8703.24.40<br><br>8703.31.30, 8703.31.40,<br>8703.31.50, 8703.31.60<br><br>8703.32.30, 8703.32.40<br><br>8703.33.30, 8703.33.40<br><br>8703.40.13, 8703.40.14,<br>8703.40.15, 8703.40.16,<br>8703.40.21, 8703.40.22,<br>8703.40.25, 8703.40.26,<br>8703.40.33, 8703.40.34,<br>8703.40.43, 8703.40.44,<br>8703.40.63, 8703.40.64,<br>8703.40.83, 8703.40.84<br><br>8703.50.13, 8703.50.14,<br>8703.50.15, 8703.50.16,<br>8703.50.21, 8703.50.22,<br>8703.50.25, 8703.50.26,<br>8703.50.33, 8703.50.34,<br>8703.50.43, 8703.50.44, |

උපලේඛන I. (ආරක්ෂණ ප්‍රමිතීන්/මිණුම් වියයුතු) (සම්බන්ධිතයි)

| I | II | III | | | IV | V |
|---|---|---|---|---|---|---|
| අංක | සංයෝජිත වර්ගීකරණ | ආරක්ෂණ මිණුම් | | | අදාළ සංයෝජිත වර්ගීකරණ සංකේතය | අදාල නොවන සංයෝජිත වර්ගීකරණ සංකේතය |
| | | වායු බැලූන | ආසන පටි | ABS | | |
| | | | | | | 8703.50.63, 8703.50.64,<br>8703.50.83, 8703.50.84<br><br>8703.60.13,8703.60.14,<br>8703.60.15,8703.60.16,<br>8703.60.21,8703.60.22,<br>8703.60.25,8703.60.26,<br>8703.60.33,8703.60.34,<br>8703.60.43,8703.60.44,<br>8703.60.63,8703.60.64,<br>8703.60.83,8703.60.84<br><br>8703.70.13, 8703.70.14,<br>8703.70.15,8703.70.16,<br>8703.70.21,8703.70.22,<br>8703.70.25,8703.70.26,<br>8703.70.33,8703.70.34,<br>8703.70.43,8703.70.44,<br>8703.70.63,8703.70.64,<br>8703.70.83,8703.70.84<br><br>8703.80.11,8703.80.12 |
| 03 | 87.04 | C | C | C | 8704.21.65, 8704.21.66,<br>8704.21.67, 8704.21.68<br><br>8704.31.65, 8704.31.66<br>8704.31.67, 8704.31.68<br><br>8704.21.71, 8704.21.72,<br>8704.21.91, 8704.21.92,<br>8704.21.93, 8704.21.99<br>8704.31.71, 8704.31.72,<br>8704.31.91, 8704.31.92,<br>8704.31.93, 8704.31.99 | IV තීරයෙහි සඳහන් සංයෝජිත වර්ගීකරණ සංකේත හැර 87.04 ශීර්ෂය යටතේ ඇති සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සඳහා, වායු බැලූන අවශ්‍ය නොවේ.<br><br>ආරක්ෂණ මිණුම් ත්‍රීරෝද රථ සඳහා වලංගු නොවේ<br>(8704.21.21,8704.21.22<br>8704.31.21,8704.31.22,<br>8704.31.23<br><br>8704.90.10,8704.90.20) |
| 04 | 87.05 | - | C | C | 87.05 ශීර්ෂය යටතේ ඇති සංයෝජිත වර්ගීකරණ සංකේත | - |

* (C -ආරක්ෂණ ප්‍රමිතීන්/මිණුම් වලට අනුකූල වියයුතු)

**උපලේඛන II**

| අංක | සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය |
|---|---|
| 01 | 8701 |
| 02 | 8706 |
| 03 | 8707 |
| 04 | 8708 |
| 05 | 8709 |
| 06 | 8710 |
| 07 | 8711 |
| 08 | 8712 |
| 09 | 8713 |
| 10 | 8714 |
| 11 | 8715 |
| 12 | 8716 |

සටහන් :

1. ආසන පටි - ආසන පටි සම්බන්ධයෙන් රියදුරු හා ඉදිරියේ අසුන් ගෙන සිටින මගීන් 3 Point ආසන පටි තිබිය යුතු වන අතර අනෙකුත් මගීන් සඳහා අවම වශයෙන් 2 point ආසන පටි යෙදිය යුතුය.
2. වායු බැලූන - රියදුරු සහ ඉදිරියේ අසුන් ගන්නා මගීන් සඳහා ප්‍රමිතිගත වායු බැලූන තිබිය යුතුය.
3. ABS - සියලු වාහන නිෂ්පාදනයේ දී Anti-Locking Breaking System තිබිය යුතුය.

08 - 936

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.